www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉරාකය තුල බුෂ්ගේ මිලිටරි උත්සන්නියේ ඇඟවුම්

## The implications in Iraq of Bush’s military "surge"

**ජේම්ස් කෝගන් විසිනි**
**2007 පෙබරවාරි 15**

*පහත පලවන්නේ 2007 ජනවාරි 25 සිට 27 දක්වා පැවති ඕස්ට්‍රේලියාවේ සමාජවාදී සමානතා පක්ෂ සාමාජික රැස්වීමට ජේම්ස් කෝගන් ඉදිරිපත් කල වාර්තාව ය. කෝගන් සසප මධ්‍යම කාරක සභිකයකු වන අතර ලෝසවෙඅට ඉරාකය පිලිබඳව නිරන්තර ලිපි සපයන්නෙකි.*

2006 වසර තුල දක්නට ලැබුනු බෙහෙවින් බුද්ධිමත් වර්ධනයන්ගෙන් එකක් වනුයේ ඔක්තෝබර් 11 දා ඉරාක යුද්ධයේ මරන සංඛ්‍යාව පිලිබඳව කල සවිස්තරාත්මක විමර්ශනයක් ප්‍රසිද්ධ කිරීම ය. ජෝන්ස් හොප්කින්ස් සරසවිය මගින් සිදු කර තිබූ මෙම අධ්‍යයනය ලැන්සට් වෛද්‍ය සඟරාව විසින් පිරික්සා පලකරන ලදි.

ඉරාකයේ සිදු වන දෙය වහං කිරීමට සංස්ථාපිත මාධ්‍ය දරන්නා වූ දූනුවත් ප්‍රයත්නයන් සහ යුද්ධය, ‘නිදහස’ සහ ‘ප්‍රජාතන්ත්‍රවාදය’ ගෙන එන්නේ යැයි බුෂ් පරිපාලනයේ සහ ඔවුන්ගේ ජාත්‍යන්තර හවුල්කරුවන්ගේ තොරක් නැති ප්‍රචාරයන් මධ්‍යයේ අද්‍යයනය අඳුරු යථාර්ථය පෙන්වා දෙයිඃ 2003 මාර්තු සිට 2006 ජූනි දක්වා 655,000ක තරම් ඉරාක ජනයාට දිවි අහිමි වී ඇත.

ඇමරිකානු ජනාධිපති ජෝර්ජ් බුෂ් ලැන්සට් වාර්තාව ‘විශ්වසනීයත්වයෙන් තොර’ යැයි බැහැර කලේ ය. කෙසේ වෙතත් ඉරාකය තුල සිදු කල විමර්ශනය සඳහා යොදා ගන්නේ ද හරියටම සුඩානයේ ඩාෆුර් හි සිවිල් යුද්ධයේ ප්‍රතිඵලයක් ලෙස 400,000කගේ ජීවිත අහිමි වූ බවට - නිගමනය කිරීම සඳහා යොදාගත්තා වූ ක්‍රමවේදය ම ය - ඉරාක සංඛ්‍යා ලේඛන මෙන් නොව මෙම ගනන් හිලව් ප්‍රශ්නයකින් තොර සාධකයක් ලෙස පිලිගන්නා ලදී. ඩාෆුර් මරන සංඛ්‍යාව තීරනය කලේ 2004 අග අනාථයන් 1,136කගෙන් ඔවුන්ගේ පවුල්වල මරන පිලිබඳව කරන ලද විමර්ශනයක් තුලිනි. ජාතික පරිමානව 400,000ක් ලෙස පුලුල්ව ගෙන හැර දක්වන සංඛ්‍යාවට සමාන වීමට මරන අනුපාතිකය අනාගතයටත් විහිදුවා හරින ලදී. ඉරාකයේ දී 2006 වසරේ මුල් භාගය තුල 2000කට ආසන්න පවුල් සංඛ්‍යාවකගෙන් ප්‍රශ්න කරන ලද අතර මරන සංඛ්‍යාව 65,500ක් ලෙසට තක්සේරු කරන ලදී. එක්සත් ජනපද ආක්‍රමනයේ ප්‍රති විපාක ඉතාම නිවැරදි ලෙස තක්සේරු කල වාර්තාව මෙයයි.

ඉරාකයේ මරනවලින් අඩුම තරමේ 186,000ක් වත් ඇමරිකානු ආක්‍රමනික හමුදාවල බෝම්බ හා වෙඩි උන්ඩවල සෘජු ප්‍රතිඵලයයි. “කම්පාව හා භ්‍රාන්තිය” ආක්‍රමනයේ දී පමනක් දහස් ගනනක් මිය ගියහ. 2003 අප්‍රේල් 5 වන දින බැග්ඩෑඩ් හරහා සිදු කල ආක්‍රමනයේ දී පමනක් 2000කට වඩා මරනයට පත් විය. 2004 දී ෆලූජා කර්බලා හා නජාෆ් වාසීන් තවත් දහස් ගනනක් ඉවක් බවක් නැති බෝම්බ හෙලීම්වලින් ජීවිතක්ෂයට පත් වූ අතර, සෑම දිනක ම වාගේ කැරලිකරුවන්ගේ තිප්පලවල් යැයි කියන තැන්වලට කරන ගුවන් ප්‍රහාර සහ කඩාවැදීම් හේතුවෙන් දිගින් දිගට ම ජනතාව මරුමුවට පත් වෙයි.

රටේ ආර්ථික විනාශය, ආන්ඩුවේ හෝ සිවිල් සමාජයේ රස්සාවක් පවා නොමැති වීම ද, ඇමරිකානු ආක්‍රමනයෙන් ඇවිලීගිය මිනීමරු නිකායවාදී ගැටුම්, 470,000ක් වූ අවශේෂ මරනවලට වගකිව යුතු ය.

ලෝසවෙඅ ජාත්‍යන්තර කර්තෘ මන්ඩල රැස්වීමකට 2006 ජනවාරියේ දී ඉදිරිපත් කල “ඉරාකයට එරෙහි ඇමරිකානු නායකත්වයෙන් කරන යුද්ධයේ ඵල විපාක” නම් වාර්තාවේ දී අපි, ඉරාකය තුල ඇවිලෙමින් තිබෙන සිවිල් යුද්ධයට ආක්‍රමනික ඇමරිකානු හමුදා අනුගමනය කරන ප්‍රතිපත්තීන් වගකිව යුත්තේ කෙසේ ද යන්න විමර්ශනය කිරීමට වෑයම් කලෙමු. මැද පෙරදිග කම්කරු පන්තිය සහ ජීවිතයන් අතර පැවති බලගතු සමාජවාදී ධාරාවන් බිඳදැමීම පිලිබඳව හෝ ප්‍රතිගාමී ඉස්ලාමීය බලවේගවලට විප්ලවවාදී ශක්‍යතාවක් ආරූඪ කිරීම පිලිබඳව හෝ පන්තියට ඉහලින් වාර්ගික හා ජාතික අනන්‍යතා ඔසවා තැබීම පිලිබඳව අපි විවිධාකාර ධනේශ්වර හා ස්ටැලින්වාදී පක්ෂ දේශපාලනිකව නිර්දෝෂ නොකරමු. එහෙත් කලාපය තුල විජිතවාදී පාලනය යලි ඇටවීමට වෑයම් කරමින් සිටිනුයේ ඇමරිකානු අධිරාජ්‍යවාදය වන අතර ඔවුන් එය කිරීමට මාන බලනුයේ බෙදා පාලනය කිරීමේ සාපරාධී ක්‍රමවේදය තුලිනි.

2003 මාර්තු සිට ම ඇමරිකානු පිලිවෙත්, රටේ වාර්ගික හා ආගමික ජන කන්ඩායම් අතර බෙදීම් හිතාමතාම ඇවිලවී ය. ආක්‍රමනයට සහාය දක්වූ ෂියා මූලධර්මවාදී පක්ෂ නියෝජිතයන් විසින් සදාම් හුසේන් මරාදැමීමේ දී දක්‌ වූ නිකායවාදී හිතුවක්කාරකම මෑතකම සිදු කල ප්‍රකෝපකරනයයි.

ඇමරිකාව, ඉරාකයේ ප්‍රජාතන්ත්‍රවාදය ඇති නොකලා පමනක් නොව, රට කොටස්වලට කඩා බිඳ දැමී ය. බැග්ඩෑඩයේ තෙලින් සමෘද්ධිමත් දකුනු ප්‍රදේශයේ දී ඇමරිකානු ආක්‍රමනිකයා, සදාම් හුසේන්ගේ බාත් පාලනය යටතේ බලවත්ව සිටි සුන්නි පාලක ප්‍රභූව යටපත් කර දැමීමට ෂියා, පූජකයන් සහ මූලධර්මවාදී ව්‍යාපාරයන් දිරිමත් කරයි. උතුරේදී කුර්දි ජාතිකවාදීන් තමන්ගේ ම ආන්ඩුවක් සහ මිලිටරි බලකායන් සහිත වෙනම රාජ්‍යයක් දැනටමත් සහතික කර ගෙන සිටියි.

බුෂ් පරිපාලනය විසින් ඉරාකය මත පටවන ලද ව්‍යවස්ථාව හිතාමතාම, මෙම ෂියාවාදී සහ කුර්දි වර්ගවාදී බලවේග තුල, රටේ තෙල් සූරා කෑමේ දී ඇමරිකානු සංගතවල තැරැව්කරුවන් ලෙස කටයුතු කල හැකිය යන විශ්වාසය දිරිමත් කලේ ය. බහුතරය සුන්නි අරාබි ජාතිකයන් වන ප්‍රදේශ, තිරිසන් ලෙස මර්දනය කර, ආර්ථිකව පාතාලයට ඇද දමා දේශපාලනිකව සතුරන් කර ගෙන තිබේ.

එකිනෙකා පරයා ගිය ප්‍රතිගාමී සහ කම්කරු පන්ති විරෝධීන් වන පාලක ප්‍රභූපැලැන්තියේ සියලු කොටස් භූමියේ පාලනය හා බලය සඳහා එකිනෙකා අතර ගැටුම් ඇති කර ගැනීමේ හේතුවෙන් නිකායවාදී ඝාතන සහ වාර්ගික ශුද්ධයන් ඇතිව තිබේ. පසු ගිය වසරේ පෙබරවාරි 22 සුන්නි අන්තවාදීන් ෂියාවරුන්ගේ සමාරාවේ ප්‍රධාන පල්ලියක් විනාශ කල බවට චෝදනා එල්ල වූ තැන් පටන් ඝාතනයන්ගේ පරිමාව බෙහෙවින් ඉහල ගියේ ය.

බැග්ඩෑඩය තුල ෂියා ආන්ඩුවේ ඝාතක කල්ලි හා සන්නද්ධ කන්ඩායම් සුන්නිවරුන් සමග කාකොටා ගනිති. ඉරාක අගනුවර පවතින්නේ පලිගැනීමේ සහ පලියට පලිගැනීමේ අති දුෂ්ඨ වාතාවරනයකි. දැන් මාසිකව බැග්ඩෑඩයේ සිදුවන මරන සංඛ්‍යාව 6,000 ඉක්මවයි.

මෙම ප්‍රචන්ඩත්වය ඉරාකය ජන ශූන්‍ය කරයි. රන් ශිඛරය සහිත සමාරාවේ පල්ලියට බෝම්බ දැමූ තැන් පටන් 500,000ක් ලෙස ගනන් බලා ඇති ඉරාකීයන්ට සිය ගේ දොර අහිමි වී තිබේ. දැන් විසි ලක්ෂයක් ඉරාකීයන් පිටුවාහලේ ජීවත්වන අතර තවත් ලක්ෂ 17ක් ජනයා රට තුල අවතැන්ව සිටිති. ජනගහනයේ සියයට 12කට වඩා අනාථයන් බවට පත්ව සිටී.

## ඇමරිකාවේ යුද උත්සන්නිය

කෙසේවෙතත්, අප මෙහි රැස්වන විට තේරුම්ගත යුත්තේ අප තවමත් සිටින්නේ මැද පෙරදිග සාපරාධිත්වයේ, භීෂනයේ හා ජීවිත අහිමි වීමේ මුල් අවධීන් තුල බවයි.

ජෝර්ජ් බුෂ් ජනවාරි 10 දා ඉරාකයේ ඇමරිකානු මිලිටරි ක්‍රියාන්විතයන් උත්සන්න කිරීමක් නිවේදනය කලේ ය. බැග්ඩෑඩ්වල එක්සත් ජනපද හා ඉරාක ආන්ඩුවේ හමුදා ශක්තිය ඉහල නැංවීමේත් මැයි අවසානය වන විට හමුදා භටයන් 85,000ක් සමග ඉරාක පොලිස් ඒකක ද තමා යටතට පත්වන බව නව ඇමරිකානු අනදෙන නිලධාරී ජෙනරාල් ඩේවිඩ් පෙට්රෝස් ජනවාරි 24 දා මාධ්‍ය ප්‍රකාශවලදී පැහැදිලි කලේ තමන්ද ප්‍රමුඛ ක්‍රියා කලාපයක් ඉටු කල බැග්ඩෑඩ් සැලැස්ම ක්‍රියාවට නැංවීම ඇරඹීමට එතෙක් කල් බලා සිටීමට ඇමරිකානු මිලිටරිය අදහස් නොකරන බවය.

“ගාල් කල ජනසමාජයන්” යයි බෞතීස්ම කරන ලද තත්වයකට ගෙන ඒම සැලැස්මට ඇතුලත් ය. - එනම් ඇමරිකානු හා ඉරාක සේනාංක දැවැන්ත බලයක් සහිතව නගරය පුරා විරෝධතාකරුවන්ගේ බල කඳවුරු තුලට කඩා වැදී ඕනෑ ම විරුදධත්වයක් අතුගා දමා දිස්ත්‍රික්කය අල්ලා ගැනීමයි. සටනේදී ආක්‍රමනික හමුදාවන් ආරක්ෂිත ස්ථානවල රැකවරන ලැබීම වෙනුවට කැරලිකරුවන්ගේ බලප්‍රදේශ ආසන්නයේ රැඳවීම හේතුවෙන් සිදු විය හැකි හානි සීග්‍රව ඉහල යතැයි යන පිලිගැනීම සැලැස්ම තුල ප්‍රකාශව තිබේ.

ෆයිෆා වීදිය වැනි සුන්නි අරාබි ගරිල්ලා කන්ඩායම් ශක්තිමත් ප්‍රදේශවලට දැනටමත් ප්‍රහාර එල්ල වෙමින් තිබේ. කෙසේ වෙතත් පෙට්රෝස්ට ඊට වඩා පුලුල් සැලැස්මක් තිබේ. අමරිකාව ප්‍රථම වතාවට නැගෙනහිර බැග්ඩෑඩයේ අධික ජනගහනයකින් යුත් ෂියාවාදී කම්කරු පන්තික දිස්ත්‍රික්කය වන සදර් නගරයට ඇතුල්වීමටත් මොක්ටඩා අල් සදර් ප්‍රන්තවරයාගේ අනුගාමික මාදි හමුදාව විනාශ කිරීමටත් අදහස් කරගෙන සිටියි. ආක්‍රමනික හමුදාව සහ දසදහස් ගනනක් වන සන්නද්ධ කන්ඩායම් අතර දිග් ගැස්සුනු නාගරික යුද්ධයක අඳුරු සලකුනු දක්නට ලැබේ. එවන් ක්‍රියාන්විතයක දී සිවිල් වැසියන්ගේ මරන සංඛ්‍යාව සැලකිය යුතු තරම් වනු ඇත.

සදාර්වාදී ව්‍යාපාරයට එරෙහි ප්‍රහාරයක ආරම්භක අදියර ක්‍රියාත්මක වෙමින් තිබේ. ජනවාරි 7 දා ඇමරිකානු මිලිටරිය නිවේදනය කලේ පසු ගිය දින 45 සිදු කල වැටලීම්වල දී මාදි සටන්කරුවන් 600ක් හා එහි ප්‍රධානීන් 16ක් අල්ලා ගැනීමට හැකි වූ බවය. 2004 අප්‍රේල්වල විරෝධතා නැගී ඒමෙන් අනතුරුව බැග්ඩෑඩය කර්බලා සහ නජාෆ් හි ෂියා කැරලිකරුවන් ඝාතනය මීට පෙර සිදුවූ එවන් ප්‍රකෝපකාරිත්වයකි.

ප්‍රධාන ප්‍රහාරය පෙබරවාරි මැද හරියේ දී සිදු වන බව පෙනී යයි. සදාර් නගරයේ ප්‍රහාරයට සහභාගි වීම සඳහා උතුරු ඉරාකයේ වාර්ගික කුර්ද්වරුන්ගෙන් සැදුම්ලත් ආන්ඩුවේ සේනාංක පැමිනෙමින් සිටියි. ෂියාවරුන්ගෙන් සැදුම් ලත් සේනාංක විශ්වාස කල නොහැකි යයි ඇමරිකානු මිලිටරිය කල්පනා කරයි.

ෂියා සටන්කරුවන්ට එරෙහිව කුර්ද් සේනාංක යොදා ගැනීම, සැලකියයුතු ප්‍රතිවිපාක විශේෂයෙන් ම උතුරු ඉරාකයේ අස්ථාවර කිර්කුක් නගරයේ, ජනනය

කරනු ඇත. කුර්දි ජාතිකවාදී පක්ෂ කිර්කුක් ඉරාක කුර්දිස්ථානයේ අවියෝජනීය කොටසක් ලෙස සලකති. එහෙත් නගරයේ සිටින ලක්ෂ ගනනක් වන ෂියා අරාබීන් සහ වාර්ගික ටුකමන්වරු කුර්ද් පාලනයකට නතු වීමට දැඩි ලෙස විරුද්ධ වෙති.

වාර්ගික පවිත්‍රකරනයේ චෝදනාව යටතේ කුර්ද්වරුන්ට එරෙහිව එහි සිටින මාදි හමුදාව මේ වන විටත් සටන් කර තිබේ. කුර්ද් හමුදා ඔවුන්ගේ බැග්ඩෑඩ් බල කඳවුරට පහර දුනහොත් උතුරේ වාර්ගික ප්‍රචන්ඩත්වයේ මට්ටම නාටකාකාරව උත්සන්න වනු ඇත. සිය දේශ සීමාවේ සැබෑ ලෙස ම කුර්දි රජයක් පැවතීමට විරුද්ධ තුර්කිය, මිලිටරි මැදිහත් වීමක් යුක්ති සහගත කිරීමට මෙම තත්වය යොදාගැනීමට මාන බැලීම බැහැර කල නොහැකිය.

ඇමරිකානු මිලිටරියේ බැග්ඩෑඩ් සැලසුම පිලිබඳව නිශ්චිත ප්‍රශ්න මතු වෙයි. මොක්ටඩා අල් සදර් විසින් තමන්ට සහ තමන් නියෝජනය කරන ෂියා සංස්ථාපිතය සඳහා දේශපාලන භූමිකාවකට හුවමාරුවක් ලෙස, ෂියා නැගිටීම අවසන් කල තැන් සිට 18 මසක් ගතව තිබේ. එතැන් සිට මිලිටරි ආක්‍රමනයට පක්ෂ වූ ආන්ඩුවේ ආධිපත්‍යය දරන ෂියා සභාගයේ විශාලතම කන්ඩායම ලෙස සදර් ව්‍යාපාරය මතුවී සිටී. විදේශ හමුදා රැඳී සිටීමට එරෙහිව වාචාල කතා පැවැත්වුව ද මාදි හමුදාව ඇමරිකානු හමුදාවන්ට පහර නොදෙයි.

ඇත්ත වසයෙන් ම ආක්‍රමනිකයන් සමග සහයෝගී වීමෙහි ලා සදර්ගේ හා ෂියාවාදී ප්‍රභූ පැලැන්තියේ මනාපය කෙතරම් ද යත් ෂියා ජනයාගේ විරෝධය නොතකා ඔවුන් ඇමරිකානු මිලිටරි සංස්ථාපිතයේ කන්ඩායමක් 80-20 විකල්පය යයි පවසන දෙය වෙනුවෙන් පෙනී සිටයේ ය. ජනගහනයේ සියයට 80ක් ෂියාවරුන් හා කුර්ද්වරුන් වන අතර සුන්නිවරු බොහෝදෙනා කැරලිකරුවන් වන හේතුවෙන් ඇමරිකාවට ඇති හොඳම මාවත සදර්වාදීන් ද ඇතුලු ෂියා ආන්ඩුවට සුන්නි අරාබින්ට එරෙහි වාර්ගික ලේ වැගිරීම්වලටත් කැරලිකාරිත්වය කුඩු කිරීමටත් උදව් කිරීම ය.

එසේනම් බුෂ් පරිපාලනය හරියටම එයට පටහැනිව කටයුතු කරමින් ඉරාකයේ ඇමරිකානු වැඩ පිලිවෙලට මුහුන දෙන විශාලතම තර්ජනය ෂියාවරුන්ගේ මාදි හමුදාව යයි කියා සිටින්නේ මක්නිසාද?

ඉරාකයේ ද පුලුල් වසයෙන් මැද පෙරදිග ද ඇමරිකානු පිලිවෙත තක්සේරු කිරීමේ අත්‍යවශ්‍ය කාරනාව යුද්ධය සඳහා වන පෙලඹවීම් කවරේදැයි සොයා බැලීමත් රට තුල ආර්ථික පසුබෑම සහ සමාජ ආතතිය ද ලොකු සහ කුඩා එදිරිවාදීන් සමූහයක වැඩෙන අභියෝගයන්ට ද මුහුනපා සිටින ඇමරිකානු අධිරාජ්‍යවාදය නූතන ආර්ථිකයේ තෙල් සහ ගෑස් යන ප්‍රධාන සම්පත් සූරා කෑමේ හා බෙදාහැරීමේ පාලනය සඳහා සිය මිලිටරි බලය භාවිතා කිරීමේ මාවතට එලඹ සිටී. ලෝක බලශක්ති සැපයුමේ ආධිපත්‍ය දැරීමෙන් සිය වියැකී යන ආර්ථික හා දේශපාලනික ආධිපත්‍යය රඳවා ගැනීම සහ දේශීයව පන්ති විරෝධතාවය මර්දනය කිරීම යන දෙකම ඉටු කර ගත හැකි යයි ඇමරිකානු පාලක ප්‍රභූව විශ්වාස කරයි.

ඉරාකය සඳහා වන ඇමරිකානු සැලසුම, රටේ අනාගතය හෝ එහි තෙල් ධනය බෙදාහැරීමේ තීරනය ජනතාව අතට පත් කරන ප්‍රජාතන්ත්‍රවාදයක් නොව ඇමරිකානු බලශක්ති සංගතවලට වාසිදායක ලාභ උපයා ගත හැකි වන පරිදි හා තවදුරටත් කලාපය තුල ආක්‍රමනකාරිත්වයේ කඳවුරක් ලෙස කටයුතු කරන එක්සත් ජනපද සේවාදායක රාජ්‍යයකි.

ඇෆ්ඝනිස්ථාන හා ඉරාක ආක්‍රමන ඇමරිකානු මිලිටරිවාදයේ අවසානය නොව එහි ආරම්භක අවධිය පමන ය. බැග්ඩෑඩයට ඇමරිකානු හමුදා කඩාපැන්නවීමට ඉරානයට විරුද්ධව යුද්ධයක් ඇරඹීමේ ද සමස්ත පර්සියන් බොක්කේ ම ගෙල හිර කර ගැනීම තහවුරු කිරීම ද සඳහා වන වොෂිංටනයේ පලල් සැලසුම්වලින් වෙන්කර තක්සේරු කල නොහැක.

මාදි හමුදාව ඇමරිකානු සැලසුම්වලට බාධකයක් සේ දකිනු ලැබේ. එයට සටන්කරුවන් බඳවාගනු ලබන්නේ ඇමරිකානු හමුදා එහි සිටීම හා ඉරාක සම්පත් ව්‍යාපාරවල කොල්ලයට ලක්ව තිබීම පිලිබඳවත් කෝපයෙන් පසුවන නාගරික කම්කරුවන් හා දුගීන් අතුරින් තව දුරටත් මැද පෙරදිග සිදුවන ඕනෑ ම ඇමරිකානු ආක්‍රමනයකට ඔවුහු ඒ හා සමානව ම විරුද්ධ වෙති.

හමුදා තර කිරීමේ එල්ලය වනුයේ යලිත් වතාවක් ඇමරිකානු හමුදාවන්ට එරෙහිව නැගී සිටීමට ඉඩ ඇති ෂියා භට හමුදා සමග ප්‍රකෝපකාරී ගැටුමක් අවුලුවාගෙන පූර්ව-භංග ප්‍රහාරයක් එල්ල කිරීම ය. සිය පාක්ෂිකයන් සංසුං කර තැබීමට සදර් නායකත්වය මංමුලා සහගතව දරන වෑයම් නිසා තමන්ම අපකීර්තියට පත්ව සිටින අතර, විශේෂයෙන්ම ඉරානය සමග යුද්ධයක් ඇති වුවහොත්, ඔවුන්ට පුපුරා හැලෙන අධිරාජ්‍ය විරෝධය බොහෝ කාලයක් මෙල්ල කර ගෙන සිටිය නොහැකි වනු ඇත.

ජනවාරි 18දා *නිව් යෝර්ක් ටයිම්ස්* පුවත්පතේ සිත්ගන්නා සුලු ලිපියක සදර්වාදී නායකත්වය ප්‍රදේශය තුලට කෙරෙන ඇමරිකානු කාවැදීමට විරුද්ධත්වය නොපාන්නේ ඔවුන් සිය "ඉතාලි පාවහන්" පිලිබඳව සැලකිලිමත් වන නිසා යැයි අවඥාවෙන් පැවසූ සදර් නුවර සාප්පු හිමියකු උපුටා දක්වා තිබුනි. එනම්, සදර්වාදින් ඉරාකය ඇමරිකානු විජිතයක් බවට පත් වීම වැලැක්වන බවට දුන් ජනතාවාදී පොරොන්දු ඉටුකරනවාට වඩා ආක්‍රමනය තුලින් ඔවුන් ලබා ගත්

වරප්‍රසාද භුක්තිවිඳීමට පිලිබඳව උත්සුක වන බව සාමාන්‍ය ෂියාවරුන් දැනටමත් පිලිගනියි.

ජනවාරි 24 දා බුෂ්ගේ රාජ්‍ය තත්ව වාර්තාවේ දී මාදි හමුදාව ලේ විලක ගිල්වීමට ඔහුගේ පාලනාධිකාරයට ඇති ඕනෑකම යලි තහවුරු කලේ ය. අල්කයිඩා වැනි සුන්නි පදනමක පිහිටි අන්තවාදින් ශිෂ්ඨාචාරයට ම තර්ජනයක්ව පවතින බවට කෙරෙන පරිපාලනයේ ගොරහැඩි චෝදනාවන්ට "ඉරාන සහාය ලබන ෂියා අන්තවාදීන්" ද බුෂ් එක එල්ලේ ම එකතු කලේ ය.

බුෂ් යලිදු වතාවක් අගමැති නූරි අල්-මලිකිගේ ෂියාවාදී ආන්ඩුවට ෂියා හට කන්ඩායම් මර්දනය සඳහා සහයෝගය දෙන බවට පැකිලෙමින් දුන් පොරොන්දු ඉටු කරන ලෙස අනතුරු ඇඟවී ය. ෂියා පක්ෂ ඊනියා ජාතික ඒකාබද්ධතා ආන්ඩුවක් පිහිටුවා සදාම් හුසේන් යටතේ බලය අත්කරගෙන සිටි සුන්නි පාලක ප්‍රභූ නියෝජිතයන් සමග බලය බෙදාගන්නා ලෙස ද ධවල මන්දිරය බලකර සිටියි. ඔවුන් එසේ නොකලහොත් මලිකිට විරුද්ධව යම් ආකාරයක මිලිටරි කුමන්ත්‍රනයකට වොෂිංටනය අනුග්‍රහය දක්වනු ඇත. යන්නට ඕනෑ තරම් ඇඟවීම් තිබේ.

## එක්සත් ජනපද පාලක කවයන් අතර බෙදීම්

ඉරාකයේ යුද්ධ උත්සන්න කිරීමේ බුෂ් පරිපාලනයේ තීන්දුව මගින් ඇති කල හැක්කේ බොහෝ දුරදිග යන සහ සමහර අංශවලින් සිතාගැනීමට පවා නොහැකි වන ප්‍රතිවිපාකයන් ය. බැග්ඩෑඩයේ ඇමරිකානු මූලෝපාය විමර්ශනය කෙරෙන්නේ කිසිදු අයුරකින් එය සාර්ථක වේ යැයි පැවසීම පිනිස නොවේ. ඉරාක ජනතාවගේ විරෝධය බෝම්බ දමා අවසන් කල හැකි වෙතැයි ඇමරිකානු පාලක කොටස් අතර තිබූ සංකල්පය පසු ගිය පස්වසර තුල නිෂ්ප්‍රභ වී ගොසින් ය. ලෝක ගෝලයේ එක් කෙලවරක සිට අනෙක් කෙලවර දක්වා අධිරාජ්‍ය විරෝධී මහජන මතය වැඩී ගොස් තිබේ.

තවද, ඉරාකයේ හමුදා තරකිරීම තීන්දු කලේ ඇමරිකානු ජනතාවගේ කැමැත්තට මුලුමනින්ම පටහැනිව ද, ජනතාව විරුද්ධ වන යුද්ධයක දිගට ම නිරතවීමෙන් දේශීය ස්ථාවරත්වයට මතු කෙරෙන තර්ජනය හේතුවෙන් ඇමරිකානු පාලක කොටස් අතර කටුක භේදයක කොන්දේසි යටතේ වීම ද තදින් කැපී පෙනෙයි.

පසු ගිය දෙසැම්බරයේ යුද්ධය අසාර්ථක යැයි ලේබල් ගසා "ගමන් මගේ වෙනසක්" ඉල්ලා සිටි ඉරාක අධ්‍යයන කන්ඩායම (අයිඑස්ජී) මෙම භේදයන් මූර්තිමත් කරයි.

අයිඑස්ජී හි ප්‍රධානියා ලෙස ජේම්ස් බේකර් යොමු කරන ලද හේතු පිලිබඳව රිපබ්ලිකානුවන්ගේ අතරමැදියෙක් වන ඔහුගේ හිතවතියක් වොෂිංටන් මන්ත්ලි සඟරාවට මෙසේ පවසා තිබුනි: "බේකර් මූලිකව ම පොලඹවනු ලැබුවේ රට තුල යුද්ධයක් ඇති වීම වලකාලීමේ ඔහුගේ අරගලයෙහි - එනම් යුද්ධයේ දී නොව, රට තුල සියල්ල කඩා වැටෙනු ඇති බවයි. එබැවින් ඔහුට ඇමරිකානු දේශපාලනය තුල සටන් විරාමයක් අවශ්‍ය විය."

ඉරාක යුද්ධය පිලිබඳ විරෝධතා හා ගැටුම් හේතුවෙන් ඇමරිකාව "පාලනය කල නොහැකි තත්වයකට" පත්විය හැකි යයි ඔහුගේම පක්ෂයේ හා බේකර්ගේ උත්සුකතා සටහන් කරමින් ඩිමොක්‍රටික් සම සභාපති ලී හැමිල්ටන් එයම ප්‍රතිරාවය කලේ ය. හැමිල්ටන්ටවත් බේකර්ටවත් බුෂ් පරිපාලනයේ අත්තනෝමතික මිලිටරිවාදයෙන් අඩු තරමේ තාවකාලිකව හෝ පය ආපස්සට ගන්නා කිසිදු විකල්පයක් එක්සත් ජනපද අධිරාජ්‍යවාදය වෙනුවෙන් දැක ගත නොහැකි ය.

ඇමරිකානු හමුදා ඉරාකය තුල තවත් කාලයකට රැඳී සිටිය යුතුය යි තරයේ කියා සිටින අතරේ ම, අයිඑස්ජී වාර්තාව එක්සත් ජනපද හමුදා අවදානම් සටන්වලින් ඉවත් කිරීම, ආක්‍රමන විරෝධී කැරලිවල තීව්‍රභාවය අඩු කිරීම සඳහා එයට සහන සැලසීම සහ ඇමරිකානු හිතවාදී ඉරාක ආන්ඩුවට එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන්, යුරෝපීය සංගමයෙන් සහ කලාපීය රාජ්‍යවලින් ආධාර සැපයීම පිනිස ජාත්‍යන්තර සමුලුවක් කැඳවීම ඉල්ලා සිටී. ඉරාකය ස්ථාවර කරනු පිනිස ඉරානය හා සිරියාව කෙරෙහි වන බුෂ් පරිපාලනයේ ආක්‍රමනශීලී පිලිවෙත ලිහිල් කිරීමක් අවශ්‍ය වන බව අයිඑස්ජිය තරයේ කියා සිටී.

බුෂ් පරිපාලනයේ ප්‍රතිචාරය වූයේ, මැද පෙරදිග පිලිබඳව ඇමරිකානු අධිරාජ්‍ය සැලසුම්වලින් ආපස්සට යාම කල නොහැක්කක් බව අවධාරනය කිරීම ය. කෙතරම් තාවකාලික වුවද ඕනෑ ම පසුබෑමක් සෑම තැනකදී ම ඇමරිකානු ආසක්තතා දුර්වල කර දැමීම පිනිස, එක්සත් ජනපදයේ විරුද්ධවාදීන් විසින් ඩැහැගනු ඇත. ඉරාකය යටත් කර ගැනීම සම්පූර්න කර ගත යුතු ය, ඉරානය සමග ගැටුම පෙරට ගෙන යා යුතු ය. තවතවත් යුද්ධ සූදානම් කල යුතු ය. කුඩා ධනේශ්වර කතිපයාධිකාරයේ ආර්ථික විජිගීෂාවන්ගේ ඉල්ලීම බුෂ්ගේ හමුදා තර කිරීමේ කතාවෙන් අනතුරුව පැවති සිය පුවත්පත් සාකච්ඡාවල දී, ඕනෑ ම දේශපාලන විරුද්ධත්වයක් නිසැක ද්‍රෝහීකමක් ලෙස හෙලා දුටු උප ජනාධිපති ඩික් චේනි රට තුල එහි ඇඟවීම් යලිත් අවධාරනය කලේය.

අවසාන වසයෙන්, එලැඹෙන වසරවල අපගේ වැඩ කටයුතු සිදු වනු ඇත්තේ ඉරාකයේ උත්සන්න වන මිනිස් සංහාරය, අන් රාජ්‍යවලට එරෙහි එක්සත් ජනපද ආක්‍රමනකාරිත්වය සහ එක්සත් ජනපදයේ ද

ජාත්‍යන්තරවද නැගී එන පන්ති ගැටුම්වල සන්දර්භය තුලයි. සමාජයේ දිරාපත්වීම සමාජ විප්ලවයේ අවශ්‍යතාවය වෛෂයිකව ම මතු කරයි. එම ඉදිරි දර්ශනය ජාත්‍යන්තර කම්කරු පන්තිය තුලට ගෙන ඒම අපගේ වගකීම ය. සිය ආරම්භක වාර්තාවේ දී නික් බීම්ස් විස්තර කලා සේ අපි අවිඥානික ඓතිහාසික සන්තතිය සවිඥානික දේශපාලනික ව්‍යාපාරයක් බවට පරිවර්තනය කල යුතු වෙමු.

දියුනු රටවල පැරනි කම්කරු සංවිධාන අපකීර්තියට පත්ව ඇති අතර මිලිටරිවාදය සහ නිදහස් වෙලඳපොල වෙනුවෙන් පෙනීසිටියි. හතරගාතෙන් ඔවුන් ඉදිරියේ වැටී සිටින පැබ්ලෝවාදී ප්‍රවනතා නව විජිතවාදයට සහාය දෙමින් හෝ ජනතාවගේ ඕනෑ ම විරෝධතාවයක් නිල සංස්ථාපිතයට දක්වන බෙලහීන විරෝධතාවයන්ට සීමා කල යුතු යයි කියමින් සිටිති.

පීඩිත රටවල ධනේශ්වර ජාතිකවාදීන්ට ඉදිරිපත් කල හැකි වනුයේ ගෝලීය ධනවාදයේ නියෝගයන්ට හිස නමන ගමන් වැඩි වැඩියෙන් දියාරුවන වාචාල කතා පමනි. උදාහරන ලෙස මැදපෙරදිග ඉස්ලාමීය මූලධර්මවාදී ප්‍රවනතා අධිරාජ්‍යවාදී ආක්‍රමන කර්තව්‍යයට විරෝධය පෑමට අසමත් වන්නේ වර්ගවාදයෙන් හා නිකායවාදයෙන් ජනතාව මත සිය ග්‍රහනය පවත්වා ගෙන යාමට මාන බලති.

2007 ජනවාරි 22දා අපේ ප්‍රකාශයේ දී අපි අපගේ කාර්යය සමාජවාදී අනාගතයක් සඳහා වන සටනට කම්කරු පන්තියේ ජාත්‍යන්තරව එක්සත් කිරීම ලෙස අර්ථ දැක්වීමු. එලඹෙන වසරවල දී ලෝසවෙඅය සහ සසප වෙනුවෙන් අප සැලසුම් කල කාර්යයන් තුලින් එම ඉදිරි දර්ශනය පෙරට ගෙන යනු ඇත.

© www.wsws.org